ලංසු සඳහා ආරාධනය (**Invitation for Bids**)

**(ශ්‍රී ලංකා රජයේ අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති)**

**පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පහත සඳහන් ව්‍යාපෘති සඳහා ලංසු ආරාධනා කිරීම.**

පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පහත සඳහන් ව්‍යාපෘති සඳහා පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් සහ පාතහේවාහැට ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් සුදුසුකම්ලත් අසාධු ලේඛනගත නොවූ ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන්ගෙන් ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය (National Competitive Bidding) යටතේ මුද්‍රා තැබූ ලංසු ආරාධනා කරනු ලැබේ.ලංසු ඉදිරිපත් කිරීම හා භාරගැනීමේ කොන්දේසි හා තොරතුරු පහත පරිදි ඉදිරිපත් කර ඇති බව කාරුණිකව සලකන්න.

1. අළුත්වැඩියා හා වැඩිදියුණු කාර්යයන් සඳහා ඇස්තමේන්තුගත මූලික පිරිවැය, අවශ්‍ය අවම සුදුසුකම්, ලංසු සුරක්ෂණයේ වටිනාකම, ලංසු සුරක්ෂණයේ වලංගු කාලය, ලංසු ලියවිලි ගාස්තු සහ කොන්ත්‍රාත් කාල සීමාව පහත සඳහන් කර ඇත.

| අනු අංකය | කොන්ත්‍රාත්තුව | ඇස්තමේන්තු මුදල(වැට් රහිත) රු.මි. | අවශ්‍ය CIDA ලියාපදිංචිය | ලංසු සුරක්ෂණයේ වටිනාකම රු | ලංසු සුරක්ෂණය වලංගු කාලය | ලංසු ලියවිලි ගාස්තුව (ආපසු නොගෙවන) | කොන්ත්‍රාත්තු කාල සීමාව |
|---|---|---|---|---|---|---|---|
| 01 | කපුලියද්ද ඔය වම් ඉවුර දිගේ රැඳවුම් බැම්ම ඉදිකිරීම | 8.76 | C7 – C6 | 87,585.00 | දින 105 | 1,000.00 | දින 150 |
| 02 | ගම්මැද්ද කුඹුර ප්‍රදේශයේ රැඳවුම් බැම්මක් ඉදිකිරීම | 5.20 | C8 – C7 – C6 | 51,970.00 | දින 105 | 1,000.00 | දින 90 |
| 03 | කොස්සින්න කොටස් දෙකෙහි ඇස්වැද්දුම ඇලෙහි රැඳවුම් බැම්මක් ඉදිකිරීම | 5.15 | C8 – C7 – C6 | 51,545.00 | දින 105 | 1,000.00 | දින 90 |

2. කොන්ත්‍රාත්තුව ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට,සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත වී නොතිබිය යුතු අතර,CIDA ආයතනයේ ලියාපදිංචි කරන ලද C8 , C7 , C6 ශ්‍රේණිගත කරන ලද ලියාපදිංචි වූ ආයතනයක් විය යුතුය. මිල ගණන් සමඟ වලංගු CIDA ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කල යුතුය.

3. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2026.10.05 දින සිට 2026.10.20 දක්වා සෑම වැඩකරන දිනයකම පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ සරප් වෙත ආපසු නොගෙවන නියමිත ලංසු ලියවිලි ගාස්තු ගෙවා ලබාගත් කුවිතාන්සිය ගිණුම් අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් ලංසු ලියවිලි ලබාගත හැකිය.

4. සම්පූර්ණ කරන ලද මිල ගණන් ලේඛන,BOQ, මිල උප ලේඛන, CIDA සහතිකය, ලංසු සුරක්ෂණය/ඇපකරය සහ ලංසු ලියවිලිවල ඉල්ලා ඇති තාක්ෂණික, මූල්‍ය හා අනෙකුත් සුදුසුකම් සහිත ලේඛනවල සහතික කළ පිටපත් ලංසු සමඟ නිසි පරිදි අත්සන් කර මුද්‍රා තැබූ කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

5. පූර්ව ලංසු රැස්වීම (Pre - Bid Meeting) 2026.10.13 වන දින පෙ.ව. 10.00 ට පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වේ. මිල ගණන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන කොන්ත්‍රාත්කරුවන්ට මෙම රැස්වීමට සහභාගීවීමෙන් කාර්යයේ ස්වභාවය, පිරිවිතර, ප්‍රමාණයන්, ස්ථානීය තත්වයන් සහ අනෙකුත් අවශ්‍යතා පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගත හැකිය.

6. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත හා අනුපිටපත වෙන් වෙන්ව නම් කර මුද්‍රා තබා එක කවරයකට බහා 2026.10.20 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් සහ පාතහේවාහැට ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පාතහේවාහැට යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ගිණුම් අංශයේ ගණකාධිකාරි නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ හැකිය.ලංසුපත් ඉදිරිපත් කරන කවරයේ ඉහළ වම් කෙළවරඅදාළ කොන්ත්‍රාත්තුවේ නම හා ලංසු අවසන් දිනය සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන මිල ගණන් භාර ගනු නොලැබේ.

7. මිල ගණන් භාර ගැනීම අවසන් වූ වහාම (2026.10.20 වෙනි දින ප.ව. 2.00 ට පසු) පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මිල ගණන් විවෘත කරනු ලැබේ. ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයන්ට සහභාගී විය හැකිය.

8. ලංසු විවෘත කිරීමේ දින (2026.10.20) සිට දින 77 කාලයක් වලංගු විය යුතුය.

9. සෑම ලංසුවක්ම ලංසු සුරක්ෂණය (Bid security) සමඟ ඉදිරිපත් කළ යුතුය.

10. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් ලබාගත්, ලංසු විවෘත කළ දින (2026.10.20) සිට 2027.02.02 දක්වා දින 105 ක් වලංගු වන පරිදි උපලේඛනයේ සඳහන් වටිනාකමින් කොන්දේසි විරහිත ආපසු ගෙවන ලංසු සුරක්ෂණ සහතිකයක් හෝ පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් කරන ලද තැන්පත් කිරීමක් සඳහා වූ ලදුපත ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය.මෙම ලංසු සුරක්ෂණ පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නමින් ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

එච්.කේ.සාගරිකා දිල්හානි
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සභාපති
ප්‍රාදේශීය ලේකම්
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
පාතහේවාහැට